සියලු ම හිමිකම් ඇවිරිණි

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## පදනම් විභාගය - 2011 ජූලි

## (52) ආර්ථික විද්‍යාව
Economics

2011-07-16
පස්වරුව
[2.00 - 4.00]

**කාලය: පැය 02 යි.**

- **අයදුම්කරුවන්ට උපදෙස්:**
  *(1)* මෙම පත්‍රය **A** සහ **B** යන කොටස් දෙකකින් (02) යුක්ත වේ.
  *(2)* පහත දැක්වෙන පරිදි ප්‍රශ්න **පහකට (05)** උත්තර ලිවිය යුතුය.
    - **A කොටසේ අංක 01 දරණ ප්‍රශ්නයට, සහ**
    - **B කොටසේ ඕනෑම ප්‍රශ්න හතරකට (04).**
  *(3)* ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාලව, **එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.
  *(4)* ප්‍රස්තාර කොළ සපයනු ලැබේ.
  *(5)* *ලකුණු 100.*

පිටු ගණන: 06
ප්‍රශ්න ගණන: 07

---

### A - කොටස

බහුවරණ ප්‍රශ්න
මෙම කොටසේ සියළු ම ප්‍රශ්න වලට උත්තර ලියන්න.
ලකුණු 40.

**01.** පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට **වඩාත්ම නිවැරදි** උත්තරය (1), (2), (3), (4) අතුරෙන් තෝරන්න. එසේ තෝරාගත් උත්තරයට අදාල ඉලක්කම, ප්‍රශ්නයට යොදා ඇති ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිතුරු පොතේ ලියන්න.

(A) පහත සඳහන් දෑ අතුරෙන්, ආර්ථික භාණ්ඩයක ඇති ගති ලක්ෂණයක් ඇතුලත් ප්‍රකාශය වනුයේ:

(1) එහි අසීමිත සැපයුම් නම්‍යතාවයක් තිබේ.
(2) එය පාරිභෝගිකයාට ශුන්‍ය තෘප්තියක් ලබා දේ.
(3) එය අයකිරීමකින් තොරව රජය මගින් පාරිභොගිකයාට ලබා දෙන්නකි.
(4) එහි ආවස්ථික පිරිවැයක් තිබේ.

(B) පහත සඳහන් දෑ අතුරෙන්, හීනවන ආවස්ථික පිරිවැයක් පෙන්නුම් කරන නිෂ්පාදන හැකියා වක්‍රයක (Production Possibility Curve) නිවැරදි ගතිලක්ෂණය වනුයේ:

(1) නිෂ්පාදන හැකියා වක්‍රය මූල ලක්ෂයට අවතලව පිහිටා ඇත.
(2) නිෂ්පාදන හැකියා වක්‍රය සරල රේඛීය එකක් වේ.
(3) නිෂ්පාදන හැකියා වක්‍රය මූල ලක්ෂයට උත්තලව පිහිටා ඇත.
(4) විවිධ නිෂ්පාදන මට්ටම් වලදී නිෂ්පාදන හැකියා වක්‍රය විවිධ හැඩයන් ගනී.

(C) පහත සඳහන් දෑ අතුරෙන්, වෙළෙඳපොල ආර්ථික ක්‍රමයක මිල න්‍යායෙහි කාර්යයන් සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශය වනුයේ:

(1) පාරිභොගිකයන්ට සංඥා ලබා දේ.
(2) අවශ්‍යතාවයන් අනුව ආදායමේ බෙදාහැරීමක් සිදු කරයි.
(3) නිෂ්පාදකයන්ට දිරිගැන්වීම් ලබා දේ.
(4) හිඟ සම්පත් බෙදාහැරීමේ උපක්‍රමයකි.

(D) පහත සඳහන් ඳෑ අතුරෙන්, ව්‍යුත්පන්න ඉල්ලුම සඳහා උදාහරණයක් **නොවන්නේ**:

(1) ශ්‍රමය. (2) භූමිය හෝ ප්‍රාග්ධනය.

(3) ව්‍යවසායකත්වය. (4) ස්වර්ණාභරණ.

(E) $y$ භාණ්ඩයෙහි මිල වෙනස්වීම සම්බන්ධයෙන් $x$ භාණ්ඩය සඳහා හරස් ඉල්ලුම් නම්‍යතාවය ශූන්‍ය නම්, $x$ හා $y$ භාණ්ඩ විස්තර කළ හැක්කේ:

(1) අනුපූරක භාණ්ඩ වශයෙනි. (2) නිදහස් භාණ්ඩ වශයෙනි.

(3) ආදේශක භාණ්ඩ වශයෙනි. (4) පොදු භාණ්ඩ වශයෙනි.

(F) නිෂ්පාදනයක අතිරේක එක් ඒකකයක් පරිභෝජනයෙන් පසු පුද්ගලයෙකු ලබා ගන්නා තෘප්තිය හඳුන්වනු ලබන්නේ:

(1) ආවස්ථික පිරිවැය. (2) ආන්තික පිරිවැය.

(3) ආන්තික උපයෝගිතාවය. (4) මුළු උපයෝගිතාවය.

(G)




ඉහත ප්‍රස්තාරයෙන් පෙන්වා ඇති පරිදි දෙන ලද ආදායමකදී පහත සඳහන් ඳෑ අතුරෙන්, කුමකින් උපේක්ෂා වක්‍රය $ID_2$ සිට $ID_1$ දක්වා විතැන් විය හැකිද?

(1) $x$ හා $y$ භාණ්ඩ දෙකෙහිම මිල අඩුවීමකින්.

(2) $x$ භාණ්ඩයෙහි පමණක් මිල අඩුවීමකින්.

(3) $x$ භාණ්ඩයෙහි පමණක් මිල වැඩිවීමකින්.

(4) පාරිභෝගිකයාගේ මූර්ත ආදායම් මට්ටමෙහි වැඩිවීමකින්.

(H) පහත සඳහන් ඳෑ අතුරෙන්, ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට විතැන්වීම සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශය වනුයේ:

(1) විලාසිතාවෙහි වෙනස් වීමක්. (2) භාණ්ඩයේ මිලෙහි අඩුවීමක්.

(3) භාණ්ඩයේ මිලෙහි අපේක්ෂිත වැඩිවීමක්. (4) අනුපූරකවල මිලෙහි අඩුවීමක්.

(I) $X$ භාණ්ඩය සඳහා ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර පහත සඳහන් ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරන අතර සමතුලිත මිල **OP** සහ සමතුලිත ප්‍රමාණය **OQ** වේ.




ඉහත ප්‍රස්තාරයෙන් පෙන්වා ඇති පරිදි අඳුරු කර ඇති ප්‍රදේශය (PAE) පෙන්නුම් කරන්නේ:

(1) ආයතනයේ නිෂ්ප්‍රමාණික ලාභය. (2) ආර්ථික බදු කුලිය.

(3) සංක්‍රාම ඉපැයුම්. (4) පාරිභොගික අතිරික්තය.

(J) පහත සඳහන් දෑ අතුරෙන්, කුටුම්භ අංශයෙහි කාර්යයක් වන්නේ:

(1) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සහ සැපයීම.

(2) භාණ්ඩ හා සුභසාධන පහසුකම් සැපයීම.

(3) නිෂ්පාදන සාධක සැපයීමෙන් ආදායම් ඉපැයීම.

(4) විදේශ වෙළඳාමට සම්බන්ධ වීම.

(K) රටක එක් වර්ෂයක් සඳහා ජාතික ආදායම් විස්තර පහත සඳහන් වගුවෙන් පෙන්නුම් කරයි.

| | | රු. (දශ ලක්ෂ) |
|---|---|---|
| 1. | දල දේශීය නිෂ්පාදිතයෙහි (GDP) සාධක පිරිවැය මිලට | 50,000 |
| 2. | ප්‍රාග්ධන වියදම් | 5,000 |
| 3. | වක්‍ර බදු | 9,000 |
| 4. | නිර්යාත | 5,000 |
| 5. | සහනාධාර | 1,000 |
| 6. | ආයාත | 6,000 |

ඉහත සඳහන් දෑ අතුරෙන්, වෙළෙඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතයෙහි (Gross Domestic Product) වටිනාකම වනුයේ:

(1) රු. දශ ලක්ෂ 60,000/-. (2) රු. දශ ලක්ෂ 61,000/-.

(3) රු. දශ ලක්ෂ.58,000/- . (4) රු. දශ ලක්ෂ 57,000/-.

(L) පහත සඳහන් දෑ අතුරෙන්, රජයේ අයවැය ලේඛනයෙහි සංක්‍රාම ගෙවීමක් වනුයේ:

(1) රජයේ සේවකයන්ගේ වැටුප්. (2) රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම.

(3) අයකිරීමකින් තොරව පාසැල් පොත් සැපයීම. (4) නව පාරක් තැනීම සඳහා ගෙවීම.

(M) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව 2010 වර්ෂයෙහි රටේ ආර්ථික වර්ධනය වූයේ:

(1) 6% කි. (2) 8% කි. (3) 4.8% කි. (4) 7.5% කි.

(N) පහත සඳහන් දෑ අතුරෙන්, මුදලෙහි වඩාත්ම සුදුසු නිවැරදි නිර්වචනය වනුයේ:

(1) එය විනිමය මාධ්‍යයකි.
(2) එය වටිනාකම් රුස්කර තබා ගැනීමේ මාධ්‍යයකි.
(3) ආර්ථිකයක විවිධාකාර වූ භාණ්ඩ හා සේවා හුවමාරු කිරීම සඳහා මාධ්‍යයක් වශයෙන් පිළිගන්නා ඕනෑම දෙයකි.
(4) එය ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කරයි.

(O) පහත සඳහන් දෑ අතුරෙන්, බැංකු මුදල් වශයෙන් සැලකිය හැක්කේ කුමක්ද?

(1) කාසි සහ නෝට්ටු.
(2) නෛසර්ගික වටිනාකම මුහුණත වටිනාකමට සමාන මුදල්.
(3) බැංකුවල ඇති තැන්පතු.
(4) වාණිජ බැංකුවල තිබෙන මහජනයා සතු ඉල්ලුම් තැන්පතු.

(P) උද්ධමනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(1) සාමාන්‍ය මිල මට්ටම නොකඩවා අඩුවීමේ ප්‍රවණතාවය.
(2) සාමාන්‍ය මිල මට්ටම නොකඩවා වැඩිවීමේ ප්‍රවණතාවය.
(3) මුදලෙහි වටිනාකම නොකඩවා වැඩිවීමේ ප්‍රවණතාවය.
(4) සේවා වියුක්තිය නොකඩවා වැඩිවීමේ ප්‍රවණතාවය.

(Q) රජය සිය අයවැයෙන් රු. දශලක්ෂ 50 ක් නව පාරක් තැනීම සඳහා වෙන් කළහොත් එම වියදම සැලකිය හැක්කේ:

(1) පාරවල් පාවිච්චි කරන්නන් සඳහා දෙන සහනාධාරයක් ලෙසය.
(2) රජයේ පුනරාවර්තන වියදමක් ලෙසය.
(3) රජයේ ප්‍රාග්ධන වියදමක් ලෙසය.
(4) රජයේ සංක්‍රාම ගෙවීමක් ලෙසය.

(R) රටක ආර්ථික වර්ධනය මැනීමට පහත සඳහන් දෑ අතුරෙන් කුමක් භාවිතා කරයිද?

(1) පාරිභෝගික සුරක්ෂිතතාවය.
(2) දුප්පත්කම අඩුකිරීමට ගන්නා ක්‍රියා මාර්ග.
(3) ජාතියක මුළු නිෂ්පාදිතය කාලයක් පුරා වැඩිවීම.
(4) ආර්ථික වර්ධනය පවත්වාගෙන යන අතරතුර ආර්ථික අසමානතාවය අඩු කිරීම.

(S) බදු අනුකූලතාව (tax compliance) නිර්වචනය කළ හැක්කේ:

(1) ඉහළ ආදායම් කාණ්ඩ සඳහා බදු අනුපාතය වැඩි කිරීම.

(2) සමහර කර්මාන්ත සහ ව්‍යාපාර බදු වලින් සම්පූර්ණයෙන් නිදහස් කිරීම.

(3) බදු නීතිරීති හා සම්බන්ධයෙන් ගොනු කිරීම, ගෙවීම් කිරීම සහ වාර්තා කිරීමට බදු ගෙවන්නන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම.

(4) එය බදු අයකළ යුතු වටිනාකමේ ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ කිරීමකි.

(T) පහත සඳහන් දෑ අතුරෙන්, අයවැය හිඟයක් මූල්‍යායනය කිරීමේ ප්‍රසාරණාත්මක ප්‍රභවය වනුයේ:

(1) පෞද්ගලික ඉතිරිකිරීම් භාවිත කිරීම.

(2) භාණ්ඩාගාර බිල්පත් මහජනතාවට විකිණීම.

(3) සේවක අර්ථසාධක අරමුදලෙන් (EPF) ණය ගැනීම.

(4) වාණිජ බැංකු වලින් ණය ගැනීම.

(එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40)

## B - කොටස

මෙම කොටසෙන් **ඕනෑම ප්‍රශ්න හතරකට (04)** පමණක් උත්තර ලියන්න.

ලකුණු 60

**02.** (a) (i) හිඟකම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

(ii) හිඟකම හා තේරීම අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(b) මූලික ආර්ථික ගැටළු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(c) වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක මූලික ආර්ථික ගැටළු විසඳන්නේ කෙසේද? (ලකුණු 04)

(මුළු ලකුණු 15)

**03.** (a) පූර්ණ තරඟයක ප්‍රධාන ගතිලක්ෂණ පහක්(05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(b) පූර්ණ තරඟය යටතේ ඇති ආයතනයක දිගුකාලීන සමතුලිතතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(c) (i) කතිපයාධිකාරය (oligopoly) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 01)

(ii) කතිපයාධිකාරයක ප්‍රධාන ලක්ෂණ ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 15)

**04.** (a) "හීනවන ආන්තික උපයෝගීතාවය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. උදාහරණයක් ලියන්න. (ලකුණු 05)

(b) ආන්තික උපයෝගිතා න්‍යායෙහි අවාසි මොනවාද? (ලකුණු 05)

(c) ඉල්ලුම තීරණය වන සාධක සඳහන් කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

**05.** (a) සංවෘත ආර්ථිකයක (closed economy) ජාතික ආදායමෙහි වෘත්තාකාර ප්‍රවාහයක් පහත සඳහන් රූප සටහනෙන් පෙන්නුම් කරයි.




| | |
|---|---|
| (i) | ආයතන |
| (ii) | කුටුම්භ |
| (iii) | නිෂ්පාදන සාධක |
| (iv) | භාණ්ඩ හා සේවා |
| (v) | මිලදී ගැනීම් සඳහා වියදම් |
| (vi) | සාධක ආදායම් |

ඉහත කොටුවෙහි සපයා ඇති පද ලැයිස්තුව භාවිතයෙන් රූපසටහනේ පෙන්වා ඇති ඉංග්‍රීසි අකුරු සඳහා වඩාත් නිවැරදි පදය තෝරන්න. (ලකුණු 03)

(b) ජාතික ආදායම තක්සේරු කිරීම සඳහා භාවිත කරන ප්‍රවේශයන් (විධි) තුන(03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(c) කිසියම් වර්ෂයක රටක ජාතික ආදායම් ගිණුම් වලින් පහත සඳහන් දත්ත ලබාගෙන ඇත.

| | | රු. (දශ ලක්ෂ) |
|---|---|---|
| 1. | පාරිභෝගික වියදම | 29,000 |
| 2. | රජයේ පරිභෝජනය | 8,000 |
| 3. | දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 8,000 |
| 4. | සහනාධාර | 1,000 |
| 5. | විදේශ ශුද්ධ සාධක ආදායම | 1,000 |
| 6. | වක්‍ර බදු | 8,000 |
| 7. | ආයාත | 5,000 |
| 8. | නිර්යාත | 4,000 |
| 9. | ප්‍රාග්ධන පරිභෝජනය | 4,000 |

දළ ජාතික නිෂ්පාදිතය (GNP) සාධක පිරිවැය මිලට ගණනය කරන්න. (ලකුණු 06)
(මුළු ලකුණු 15)

**06.** (a) "පුළුල් මුදල් සැපයුම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(b) (i) "මුදලෙහි වටිනාකම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

(ii) "සාමාන්‍ය මිල මට්ටම" හා "මුදලෙහි වටිනාකම" අතර සම්බන්ධය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(c) උද්ධමනයෙහි ප්‍රතිඵල මොනවාද? (ලකුණු 05)
(මුළු ලකුණු 15)

**07.** (a) "ආර්ථික වර්ධනය" හා "ආර්ථික සංවර්ධනය" අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

(b) රටක ආර්ථික වර්ධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාවට නැංවිය යුතු ක්‍රියාමාර්ග පහක්(05) සඳහන් කරන්න. (ලකුණු 05)

(c) ශ්‍රී ලංකාව තුළ එළවළු මිල උච්චාවචනය වීම සඳහා හේතු පහක්(05) සඳහන් කරන්න. (ලකුණු 05)
(මුළු ලකුණු 15)

- o0o -